# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## නිවාස භාරකරු/අරක්කැමි (කොන්ත්‍රාත් පදනම මත) තනතුර

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින නිවාස භාරකරු/අරක්කැමි (කොන්ත්‍රාත් පදනම මත) තනතුර සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

(I). දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 04 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

හෝ

තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ අරක්කැමි/කාමර සහායක යන ක්ෂේත්‍රයන්ට අදාළව NVQ- 03 වෙනි මට්ටමේ ජාතික සහතිකයක් තිබීම.

(II). සංචාරක බංගලාවල ගෘහ භාණ්ඩ, පිඟන් භාණ්ඩ, කෑම මේස උපකරණ, රෙදි පිළි ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම, බංගලා පරිශ්‍රයේ උද්‍යාන නඩත්තු කිරීම සහ ආහාර පිසීම පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු අතර භාණ්ඩ වට්ටෝරු ලේඛන පවත්වාගෙන යාමේ හැකියාව තිබිය යුතුය.

(III). නියම කරනු ලබන සංඛ්‍යාවකට පෙරදිග හා අපරදිග ආහාර පිසීම හා සැකසීම පිළිබඳ දැනුම ලබා තිබිය යුතුය.

**වැටුප** : රු. 48,000.00 (සියලු දීමනා ඇතුළත්)

**වයස** : අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**ප්‍රතිලාභ** : තෝරා ගන්නා අය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වන අතර ඔවුන්ගේ ස්ථාවර මාසික දීමනාවෙන් 8% ක ප්‍රමාණයක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් 12% කට සමාන ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවනු ඇත. ඊට අමතරව ඔවුන්ගේ ස්ථාවර මාසික දීමනාවෙන් 3% ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවනු ඇත.

**අයදුම් කලයුතු ආකාරය :**

තමන් විසින් සකස් කරන ලද අධ්‍යාපන සුදුසුකම් හා අදාළ ක්ෂේත්‍රයේ පලපුරුද්ද පිළිබඳ තොරතුරු ඇතුළත් අයදුම්පතක් සහතිකවල පිටපත්ද සමඟ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ යන ලිපිනයට 2024.12.03 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් එවීමට හෝ පැමිණ භාරදීමට හැකිය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. සහතිකවල පිටපත් සමඟ 2024.12.03 දිනට පෙර විශ්වවිද්‍යාල වෙත ලැබෙන අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා කැඳවීමට සලකා බලනු ලැබේ.

**සැලකිය යුතුය :** මෙම පුරප්පාඩු පවතින්නේ පහත සඳහන් ප්‍රාදේශිය/අධ්‍යයන මධ්‍යස්ථානවල පමණි.

* නාවල ප්‍රධාන පරිශ්‍රයේ
* මහනුවර ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ
* යාපනය ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ
* කිලිනොච්චි අධ්‍යයන මධ්‍යස්ථානයේ

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ

2024.11.20